# 10 ශ්‍රේණිය

# ශිල්ප කලා

## උද්‍යාන අලංකරණය







අන්තර්ගතය - එස්.එම්.එස්.පුෂ්පකුමාරි මිය - ගුරු උපදේශක - රත්නපුර අධ්‍යාපන කලාපය

Copyright © e-thaksalawa.moe.gov.lk

මිනිසා තමාට වාසය කිරීමට නිවාස තනාගත් අතර එම නිවස පිහිටි පරිසරය ද අලංකරණයකර ගැනීමට විවිධ ක්‍රමවේද අනුගමනයකර ඇත.

මෙම පරිසර අලංකරණ පිළිබඳ අතීතයට පිවිසීමේදී විවිධ උයන්හී නටඹුන් වී ගිය කොටස් තුළින් ඒ බව සනාථ වේ.

ලෝක ඉතිහාසයේ ඉපැරණිතම ශිෂ්ඨාචාරයන් වූ මොහෙන්ජදාරෝ හරප්පා මෙන්ම ඉන්දු නිම්න ශිෂ්ඨාචාරයන්හී කැණීම් තුළින් මතු වූ විවිධ මූර්ති කොටස් මෙන්ම බටහිර ජාතීන්ගේ පුනරුද සමයේ සකස් කළ ***වීනස් දෙව් දුවගේ ප්‍රතිමාව, ඩේවිඩ් ප්‍රතිමාව*** ආදිය හැඳින්විය හැකිය.





ශ්‍රී ලාංකේයන් වන අපටද එවන් උද්‍යාන අලංකාර ක්‍රම තිබූ බව අනුරාධපුර, පොළොන්නරු ආදී නටඹුන් තුළින් පැහැදිලිව පෙන්වා දිය හැකිය.

- අනුරාධපුර රන්මසු උයන
- සීගිරි උද්‍යානය

ඊට හොඳම උදාහරණයෝ වෙති.





අනුරාධපුර කුට්ටම් පොකුණ අසල ඇති පුන් කලස් ආසියාවේ ඇති උසස්ම පුන්කලස් වන අතර සීගිරි උද්‍යානයේ ඇති ජල මල් අතීත ශ්‍රී විභූතිය හා අතීත නිර්මාණ ශිල්පීන්ගේ දස්කම් විදහා දක්වන කැටපත් බඳුය.

බටහිර ජාතීන්ගේ පැමිණීමෙන් අනතුරුව ඔවුන්ගේ සංස්කෘතිය මිශ්‍ර වූ සංකල්පයන්ද රැගත් උද්‍යාන අලංකරණ නිර්මාණයට නිර්මාණ ශිල්පීන් පෙළඹී ඇති බව එම යුගයන් හී ඉදි වූ මන්දිර ඇසුරින් පැහැදිලි වේ.

උදාහරණ :-

- කළුතර රිච්මන්ඩ් කාසල් මැදුර
- හපුතලේ පිහිටි එඩිෂන් බංගලාව

ආදී ස්ථානවල පවතින උද්‍යාන මූර්ති







- කළුතර රිච්මන්ඩ් කාසල් මැදුර



- හපුතලේ පිහිටි එඩිෂන් බංගලාව

වර්තමානය වන විට බොහෝ දෙනෙකු තම වත් පොහොසත්කම් අනුව ඔවුන් ජීවත් වන නිවස හා ගෙඋයන අලංකරණයට ක්‍රියා කරයි. එබැවින් උද්‍යාන අලංකරණ කලාව විශේෂ ආර්ථික වාසි ගෙන දෙන කලාවක් ලෙස ප්‍රචලිතව පවතී.

එබැවින් උද්‍යාන අලංකරණ උපාංග වෙළඳ පොළෙන් මිලදී ගැනීමට හැකියාව ඇති අතර තම කැමැත්ත අනුව නිර්මාණ ශිල්පීන්ලවා ඉදිකර ගැනීමට හැකියාව ලැබේ.









මෙම අලංකරණ කෘති නිර්මාණයේ දී මූර්ති හා කැටයම් යන ක්‍රම ශිල්ප දෙකම භාවිත කරනු ලබයි. මූර්ති ගොඩනැගීමේ පහත දැක්වෙන ක්‍රම ශිල්ප යොදා ගනී.

## 1) පූර්ණ උන්නත

එනම් නිර්මාණයට යොදා ගන්නා මාධ්‍යයෙන් මූර්තියේ හෝ කැටයමේ සම්පූර්ණ මතුවීම පෙන්නුම් කිරීම සිදු කිරීමයි.

උදාහරණ :-

- අවුකන පිළිමය
- දඹේගොඩ බෝසත් රුව

ආදී පිළිම හැඳින්වීමට හැකිය.





## 2) අර්ධ උන්නත

නිර්මාණයට යොදා ගන්නා මාධ්‍යය තුළින් සම්පූර්ණ මතු නොකළ ඉදිරි පෙනුම පමණක් මතුකර දක්වනු ලබන කැටයම් හෝ මූර්තිය



උදාහරණ :-

- ඉසුරුමුණියේ පෙම් යුවල
- බුදුරුවගල බෝසත් පිළිම

ආදිය මීට උදාහරණ ලෙස දැක්විය හැකිය.



තවද මෙම නිර්මාණයන් ස්වාභාවික හැඩයෙන්ම නිර්මාණය කරන්නේද නැතහොත් වියුක්ත හැඩ තල යොදා ගන්නේද යන්න නිර්මාණ ශිල්පියා සතු කාර්යය භාරයකි.

උද්‍යාන මූර්තියක් නිර්මාණයකර ස්ථානගත කිරීමේ දී සැලකිය යුතු මූල ධර්මයන් කීපයක් ඇත. එසේ මූල ධර්මයන්ට අනුගත නොවීම තුළින් අප නිර්මාණය කරන්නා වූ මූර්තිය තුළින් බලාපොරොත්තු වන්නා වූ අලංකාරය හිමිකර ගත නොහැකි වනු ඇත.

ඒ සඳහා නිර්මාණ ශිල්පියා භූමියේ පිහිටීම, ප්‍රමාණය, හිමිකරුගේ රුචිකත්වය අනුව පහත මූල ධර්මයන්ට අනුගතව සිය නිර්මාණ කාර්යයේ යෙදෙති.

- ***අවකාසය***

  නිර්මාණය ස්ථාන ගත කිරීමට සුදුසුම ස්ථානය තෝරා ගැනීම

- ***සම්පිණ්ඩනය***

  නිර්මාණයට ගැළපෙන හැඩතල එකතුකරන්නා වූ ආකාරය

- ***අනුග්‍රහකය***

    හැඩතල සඳහා භාවිත කරන ප්‍රමාණයන් පිළිබඳ අවබෝධය, අත්, පා, හිස ආදී අංග පිළිබඳ ප්‍රමාණවත් බව

- ***විවිධත්වය***

    නිර්මාණයේ අගය උද්දීපනය සඳහා අනුගමනය කරන නිර්මාණශිලී ක්‍රමවේද

- ***තෝරා ගන්නා ස්ථානය***

    මූර්තිය ස්ථානගත කිරීම

- ***සමබරතාවය***

    මූර්තිය හෝ කැටයම පුරාම පැවතිය යුතු ගැලපීම සමබරතාවයයි

- ***කැපී පෙනෙන සුළු බව***

    නිර්මාණය ගොඩ නැගීමෙන් අනතුරුව එය දර්ශනය වන ආකාරය ඉස්මතු කිරීම මේ තුළින් සිදු වේ

- ***නිමාව***

    ඉහත මූල ධර්ම සියල්ලම එක්කර මූර්තිය හෝ කැටයම ගොඩනංවා නිම කිරීම

උද්‍යාන මූලධර්ම පිළිබඳ අවබෝධයලත් ඔබට එම නිර්මාණයන් සකස්කරලීමට යොදා ගන්නා මාධ්‍යයන් පිළිබඳ හඳුන්වා දීමට කැමැත්තෙමි.

මේ සඳහා,

- ගල්
- ලෝහ
- කිරිගරුඬ
- දැව
- සිමෙන්ති
- ප්ලාස්ටර් ඔෆ් පැරිස්

යන මාධ්‍යයන් යොදා ගනියි.











අතීතයේ කලු ගලින් නෙලූ පිළිම වර්තමානයේ පවා නොනැසී පවතින අයුරු හඳුනා ගැනීමට පහත රූප රාමු නරඹන්න.

- සමාධි පිළිමය
- අවුකන පිළිමය
- පොළොන්නරුව ගල් විහාර පිළිම
- පැරකුම්බා පිළිමය
- සීගිරියේ සිංහ පාද









වර්තමානයේ උද්‍යාන අලංකරණ සඳහා බොහෝ විට සිමෙන්ති හා ප්ලාස්ටර් ඔෆ් පැරිස් යොදාගනු ලැබේ. වෙළඳ පොළෙහි අළෙවි වන නිර්මාණයන් බොහෝමයක් සඳහා භාවිතකර ඇත්තේ මෙම මාධ්‍යයන්ය.

***සිමෙන්ති මාධ්‍යයෙන් මූර්තියක් නෙලන ආකාරය පියවර යටතේ ඉගෙන ගනිමු.***

- පළමුව අදාළ නිර්මාණයේ සැකිල්ල දැල් හෝ කම්බි මඟින් සකස්කර ගත යුතුය.







❖ සාදාගත් සැකිල්ල සිමෙන්ති මිශ්‍රණය යොදා පුරවා ගන්න. (සිමෙන්ති හා සිහින් වැලි අනුපාතයට යොදා) පුරවා ගැනීමෙන් අනතුරුව අවශ්‍ය හැඩතල මතුකර ගන්න.





- සකස් කිරීමෙන් අනතුරුව වියළීමට තබා කැමති වර්ණයක් භාවිතකර අලංකරණයකර ගත යුතු වේ. මේ සඳහා ***ඉමල්ෂන් තීන්ත, ලැකර්*** හා ***වාර්නිස්*** වර්ග යොදා ගත හැකිය.







මෙසේ සකස්කර ගත් මූර්ති හෝ කැටයම් අව්වට, වැස්සට, පින්නට ඔරොත්තු දීමේ හැකියාව මතත් එහි පවිත්‍රතාව ආරක්ෂාව මතත් දීර්ඝ කාලීනව පවත්වා ගත හැකිය. දුර්වර්ණ වූ අවස්ථාවන් හී නැවත වර්ණ ගන්වා අලංකරණය කිරීම තුළින් මූර්තිය නෙත ගැටෙන්නන් හට එහි අභිමානය දිස්වෙනු ඇත.

නිර්මාණ ශිල්පීන්ට ද ආර්ථික වාසි ලඟාකර දෙන ස්වයං රැකියාවක් වනු ඇත.




